# සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
# நலன்புரி நன்மைகள் சபை
# WELFARE BENEFITS BOARD

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
**Ministry of Finance, Economic Stabilaization & National Policies**

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

| මගේ අංකය / எனது இல / My No. | WBB/02/Notice/D/Div.S/2022 | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | 2022.12. 30 |
|---|---|---|---|---|---|

සියලු ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**සුභසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීම සඳහා සුදුසු තැනැත්තන් / පවුල් හඳුනා ගැනීම - 2022 වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් කරනු ලබන වියදම් ප්‍රතිපූර්ණය කිරීම**

සුභසාධක ප්‍රතිලාභ පනතට අනුව ප්‍රතිලාභ ලැබීමට සුදුසු පුද්ගලයන්/පවුල් හඳුනා ගැනීමේ වැඩසටහන - 2022 යටතේ ඉල්ලුම්පත් කැඳවීම මේ වන විට අවසන් කර ඇති අතර ලැබුනු අයදුම්පත් 3,723,836 ක තොරතුරු දත්ත පද්ධතියට ඇතුළත් කර තිබේ.

02. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට දැරීමට සිදුවන වියදම් සඳහා මුදල් ලබා දීම සහ වියදම් සිදු කිරීමේ පටිපාටිය සම්බන්ධයෙන් 2022.09.29 දිනෙන් ඔබ වෙත එවූ උපදෙස් ලිපියේ සඳහන් කරන ලද ලිපිද්‍රව්‍ය හා අන්තර්ජාල සබඳතා, QR කේත මුද්‍රණ කටයුතු, පරිගණක, පුහුණු, සන්නිවේදනය සහ වෙනත් වැය අයිතමයන් යටතේ වියදම් කළ යුතු ආකාරය පැහැදිලි කරන ලදි.

03. ඉහත සඳහන් සියලු වැය අයිතමයන්ගේ එකතුව අයදුම්පත්වල දත්ත පද්ධතියට ඇතුළත් කිරීමේ සිට QR කේතය මුද්‍රණය කිරීම දක්වා දැරීමට සිදුවන සියලුම වියදම් සැලකිල්ලට ගෙන එක් අයදුම්පතකට රු.38.00 ක මුදලක් දැරීමට සිදු වේ යැයි හා එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ලැබෙන උපරිම අයදුම්පත් ගණන 12,000 වේ යැයි උපකල්පනය කර ඇස්තමේන්තු කරන ලදී.

04. එසේ වුවද පද්ධතියට දත්ත ඇතුළත් කිරීම කඩිනමින් සිදු කිරීම සඳහා,

1. ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමෙන් යොදවන ලද නිලධාරීන් සංඛ්‍යාව වැඩි කිරීම.
2. පැවති පරිගණක සංඛ්‍යාව ප්‍රමාණවත් නොමැති බැවින් මූලික අයදුම්පත්‍රය පෞද්ගලික දුරකතන භාවිතයෙන් ඇතළත් කිරීම සහ මෙම වැඩපිළිවෙල සාර්ථකව හා කඩිනමින් සිදුකර ගැනීම සඳහා එක අයදුම්පතක් සඳහා රු. 10.00 ක දීමනාවක් ලබා දීමට තීරණය කරන ලදී.

05. ඔබ විසින් කරනු ලැබූ ඉල්ලීම් සලකා බලා මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරනු ලැබූ අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව ඉහත සඳහන් සියලු වියදම් දැරීමට එක් අයදුම්පත්‍රයක් වෙනුවෙන් රු.50.00 ක් ගෙවීමටත්, නිවාස ඒකක වෙත ගොස් දත්ත රැස් කරන නිලධාරීන් වෙනුවෙන් එක් අයදුම්පතක් සඳහා රු.150.00 ක මුදලක් ගෙවීමටත් 2022 නොවැම්බර් මස 21 දින අංක 080/604/1891/22 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.

කාර්යාලය / அலுவலகம் / Office — Tel: 009411- 2151481, 009411- 2484600/4117, Fax: 009411- 2151482
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / e-mail — welfarebenefitboard2016@gmail.com, info@iwms.wbb.gov.lk
වෙබ් අඩවිය / இணையதளம் / Website — www.wbb.gov.lk

06. ඒ අනුව එක් අයදුම්පත්‍රයක් සඳහා පෙර වෙන් කළ මුදලට වඩා රු.12.00 බැගින් අමතර මුදලක් ලබා දීමට කටයුතු කරනු ලැබේ. එම මුදලින් රු. 10.00 ක් ජංගම දුරකතන භාවිතයෙන් දත්ත ඇතුළත් කිරීම වෙනුවෙන්ද ඉතුරු රු. 2.00 වෙනත් වියදම් සඳහා ද වෙන් කරනු ලැබේ. ජංගම දුරකතන භාවිතයෙන් දත්ත ඇතුළත් කළ අයදුම්පත් සංඛ්‍යාව අනුව ගෙවීම් කිරීම සඳහා පිළියෙල කළ වවුචර්පතක් සහතික කර අප වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේවුවද, ඉහත සඳහන් රු. 50.00 මුදල තුළ අයදුම්පතක දත්ත ඇතුළත් කිරීමේ සිට QR කේතය මුද්‍රණය දක්වා සියලුම වියදම් අන්තර්ගතවන අතර ඒ වෙනුවෙන් වෙනත් කිසිඳු අමතර මුදලක් ගෙවනු නොලබන බව ද සිහිපත් කරනු කැමැත්තෙමි.

07. ඔබේ ප්‍රා.ලේ කාර්‍යාලයට ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව 12000 සීමාව ඉක්මවන්නේ නම් ඉහත කී සංශෝධනය අනුව ඇස්තමේන්තු කරන ලද මුදල වෙනස් විය යුතු බැවින් එවැනි අවස්ථාවල මීට පෙර ලබා දී ඇති උපදෙස් පරිදි සකස් කරනු ලබන සංශෝධිත ඇස්තමේන්තුව 2023 ජනවාරි 27 දිනට පෙර සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු අතර ඒ අනුව අදාළ ප්‍රතිපාදන ලබා දීමට කටයුතු කරන බව වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

බී.විජයරත්න
සභාපති/කොමසාරිස්
සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
o/c

පිටපත - සියලුම දිසාපතිවරුන් - කරු.දැ.ගැ.ස.

කාර්යාලය / அலுவலகம் / Office — Tel: 009411-2151481, 009411-2484600/4117, Fax: 009411-2151482
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / e-mail — welfarebenefitboard2016@gmail.com, info@iwms.wbb.gov.lk
වෙබ් අඩවිය / இணையதளம் / Website — www.wbb.gov.lk